**රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා වූ ජාතික නියෝජිතායතනය - 2020**

-----------------------------------------------------------------------------------------------------------------

රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා වූ ජාතික නියෝජිතායතනයෙහි 2019 ජුනි 01 වන දින සිට 2020 පෙබරවාරි 19 වන දින දක්වා මාස 08 ක කාලය සඳහා වූ අරමුදල් භාවිතය පිළිබඳ ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව (IBRD) අතර ඇති කරගත්, 2019 ජනවාරි 30 දිනැති ව්‍යාපෘති ඇගයීම් වාර්තා අංක 138145-LK හා 2019 අප්‍රේල් 11 දිනැති ණය ගිවිසුම් අංක 8907 K ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සැපයීම හා ව්‍යාපෘති කාල සීමාව

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියෙහි ණය ගිවිසුම අනුව, මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායනය වේ. ශ්‍රී ලංකා රංජය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා සේවා සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය මූලායයනයට ශ්‍රී ලංකා රජය මගින් පහසුකම් සැපයීම සඳහා හැකියාව ඇති කිරීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරීත්වය පිළියෙල කිරීම සඳහා සහාය දැක්වීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ. පසුව, 2020 ජනවාරි 14 වන දින පැවති රැස්වීමකදී ව්‍යාපෘතියෙහි කටයුතු අවසන් කිරීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. කෙසේ වෙතත්, මාස 08 දින 19 ක කාලය තුළ, රු. මිලියන 57 ක මුදලක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුවේ (IBRD) අරමුදල් මගින්ද, රු.මිලියන 35 ක මුදලක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින්ද, ව්‍යාපෘතිය විසින්, පිළියෙළ කිරීමේ කටයුතු සඳහා උපයෝජනය කරනු ලැබ ඇත.

1.3 මතය

------

රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා වූ ජාතික නියෝජිතායතනයෙහි 2019 ජුනි 01 වන දින සිට 2020 පෙබරවාරි 19 වන දින දක්වා මාස 08 දින 19 ක කාල සීමාව සඳහා වන අරමුදල් භාවිතය පිළිබඳ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණනකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගනන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරනයේ වගකීම වේ.

රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා වූ ජාතික නියෝජිතායනයෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්භන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

-----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවන් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්නරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මාගේ විගණනය තුළදී වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුරුවලතා හා අනෙකුත් කරුණු පිළිබඳ පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණනයේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2019 වර්ෂයේදී දේශීය අරමුදල් වලින් දරන ලද වියදම් මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත්කර තිබුණද, එම වියදම් ව්‍යාපෘතියෙහි අරමුදල් භාවිතය පිළිබඳ ප්‍රකාශයට ගෙන නොතිබුණි. | 35 | එකඟ විය. | ව්‍යාපෘතියෙහි වියදම් වෙනම දැක්විය යුතුය |

2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණනයේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) ණය ගිවිසුම උපලේඛණය 02 | | | |
| 1 - ඩී වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත පිළියෙළකර නොතිබුණි. | එකඟ විය. | ණය ගිවිසුමෙහි දැක්වෙන අවශ්‍යතා සමඟ අනුකූල විය යුතුය. |
| 1-ඉ වගන්තිය | වාර්ෂික වැඩ සැලසුම් හා අයවැය ලේඛන පිළියෙල කර නොතිබුණි. | - එම - | - එම - |
| (ආ) ව්‍යාපෘති ඇගයීම් ලේඛනය (Project Approval Document) (PAD) 24 වගන්තිය | ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර නොතිබුණි. | - එම - | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයෙහි දැක්වෙන අවශ්‍යතා හා අනුකූල විය යුතුය. |
| 2 වගන්තිය | අත්පොත හා එක්සෙල් (excel) මෘදුකාංගය පදනම් කරගත් ගිණුම්කරණ පද්ධතිය හඳුන්වා දී නොතිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2016 ජුනි 10 දරන කළමණාකරණ විගණන චක්‍රලේඛ අංක 02/20/6 | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | - එම - | රජයේ චක්‍රලේඛවල දැක්වෙන අවශ්‍යතා හා අනුකූල විය යුතුය. |

3. භෞතික කාර්යසාධනය

--------------------------

3.1 ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන්

------------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියෙහි අරමුණ ඉටු කර ගැනීම සම්බන්ධයෙන් වන ප්‍රගති වාර්තා පිළියෙල කර ඉදිරිපත්කර නොතිබුණි. | එකඟ විය | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටු කර ගැනීම හා සම්බන්ධ ප්‍රගති වාර්තා පිළියෙළ කළ යුතුය. |